**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2023**

-----------------------------------------------------------------------------------------------------

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2021 ජූනි 10 දින එළඹි අංක 2000003227 දරන ණය ගිවිසුම හා අංක 2000003226 ප්‍රදාන ගිවිසුමේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ව්‍යාපෘති ප්‍රදේශයේ ග්‍රාමීය කුඩා වතු නිවාස 40,000 ක අහිතකර බලපෑම අවම කිරීමේ හැකියාව සහ වෙළඳපොල සහභාගීත්වය ගොඩනැගීම ව්‍යාපෘතියේ අරමුණු වේ. දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් අගය දාම සඳහා ධාරිතා ගොඩනැගීම, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් අගය දාම සඳහා ආයෝජනය සහ ව්‍යාපෘති කළමනාකරණය සහ සම්බන්ධීකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,966 කට සමාන වූ එජඩො මිලියන 55.45 වන අතර ඉන් රු. මිලියන 7,698 කට සමාන වූ එජඩො මිලියන 42.75 ක් සැපයීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 2,268 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරිමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2021 ජූනි 10 දින ආරම්භ කරන ලද අතර, 2027 ජූනි 10 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ මතය අනුව, මාගේ වාර්තාවේ 2.1 වන වගන්තියේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මං දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් මාසය සඳහා රු.මිලියන 3ක කුලී වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. එබැවින් එම මුදලින් ජංගම වගකීම් අවතක්සේරු වී තිබුණි. | 2023 දෙසැම්බර් සඳහා අත්හැරනු රු.3,639,102 උපචිත කුලී වියදම පිළිබිඹු කිරීම සඳහා අප 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ඇත. අප අනාගතයේදී එවැනි අතපසුවීම් වැළැක්වීමට පියවර ගනිමින් සිටිමු. | උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කල යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව, සංසන්දනාත්මක තොරතුරු පෙර වර්ෂයේ අගයන් භාවිතා කර ඉදිරිපත් කර නොතිබුණි. | ගැටලුව නිවැරදි කිරීමට සහ අනාගතයේදී එවැනි අතපසුවීම් වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු අප ගනිමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම් සකස් කළ යුතුය. |
| (ඇ) | වර්ෂය තුල ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 34ක වත්කම් මිලදී ගැනීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සටහන් කර තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම අවසානයේ ව්‍යාපෘති කළමනාකරණයේ ආයෝජන පිරිවැයට මාරු කරනු ලබන අතර පිරිවැය ප්‍රතිපාදනවලට අනුකූල වීම සම්බන්ධීකරණය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම වත්කම්වල පැවැත්ම සහතික කිරීම සඳහා අදාළ වර්ෂය තුළ දේපළ,පිරියත හා උපකරණ එකතු කිරීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පෙන්වා ඇතත්, මුදල්වල සැබෑ සංචලනය "මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ" සටහන යටතේ පිළිබිඹු වේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කළ යුතුය. |
| (ඈ) | රු. මිලියන 3 ක් වූ ගෙවීම් වවුචර් හයක් සඳහා ශේෂය සත්‍යාපනය කිරීමට අදාළ අත්‍යවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් විගණන කළමනාකරණ කමිටුවෙහි මෙම ගැටළුව සාකච්ඡා කර පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ආරක්ෂක නිලධාරියාගෙන් සහ ඊට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ගෙන් දැනටමත් පැහැදිලි කිරීම් ලබාගෙන ඇත. මෙම තීරණය මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | විමර්ශනය කර අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි | | | |
| i. | මූ. රෙ. 138 | ගෙවීම් කිරීමට පෙර සහතික කිරීමේ නිලධාරියා විසින් වවුචර සහතික කළ යුතුය. සමහර ගෙවීම් සහතික පත්‍ර සහතික කරන නිලධාරියා විසින් සහතික කර නොමැති බව නිරීක්ෂණය විය. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | ගෙවීම් සහතිකය කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක කළ යුතුය |
| ii. | මූ. රෙ. 139(10) සහ 261(3) | මුදල් පොත සම්පූර්ණ කර ශේෂය දිනපතා තහවුරු කර ගත යුතුය. ප්‍රමාණවත් මුදලක් තිබේ නම් මිස, මුදල් පොතේ කිසිදු ගෙවීමක් සටහන් කිරීම හෝ ගෙවීම සඳහා චෙක්පතක් නිකුත් කිරීම නොකළ යුතුයි. ගෙවීම් සඳහා චෙක්පතක් නිකුත් කිරීමේදී බැංකු ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් තිබේද යන්න සැලකිල්ලට නොගන්නා බව නිරීක්ෂණය විය. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | මුදල් පොත සම්පූර්ණ කර ශේෂය දිනපතා තහවුරු කර ගත යුතුය. |
| iii. | මූ. රෙ. 371 සහ 2020 අගෝස්තු 28 දිනැති PFD/RED/01/01/2020/01 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ ඡේද 09 | අත්තිකාරම් මුදල රු.100,000 කට සීමා කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රු.6,590,385ක් වටිනා රු.100,000 ඉක්මවන අත්තිකාරම් අවස්ථා 27ක්දී ලබා දී තිබුණි. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | චක්‍රලේඛයට අනුව අත්තිකාරම් සීමා කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| iv. | මු. රෙ. 372 | අදාළ නිලධාරීන් විසින් අත්තිකාරම් නිරතුරුව පරීක්ෂා කළ යුතුය. අනුමත ඇස්තමේන්තු වලට වඩා වියදම් වන සමහර අත්තිකාරම් අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | අත්තිකාරම් පියවීම් අදාළ නිලධාරීන් විසින් නිරතුරුව පරීක්ෂා කළ යුතුය. |
| v. | මු. රෙ. 454 | සෑම දෙපාර්තමේන්තුවක් සහ දෙපාර්තමේන්තුවක උප කාර්යාලයක්ම පොදු 44 ආකෘති පත්‍රයේ බඩු ලේඛන පොතක් තබා ගත යුතු වුවද ව්‍යාපෘතිය මගින් බඩු ලේඛන පොත් නඩත්තු නොකරන බව නිරීක්ෂණය විය. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | බඩු ලේඛන පොත් ව්‍යාපෘතිය මගින් නඩත්තු කළ යුතුය. |
| vi. | මු. රෙ. 756 සහ 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනක දී සිදු කළ යුතුය. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නියමිත දිනට පත් කර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් 2023 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 34.24 ක පරිගණක සහ කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. තවද, සමීක්ෂණ මණ්ඩල වාර්තා 2024 මැයි 31 දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති විසින් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා නම් කරන ලද සාමාජිකයින් නියමිත වේලාවට අවශ්‍ය කටයුතු සඳහා කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශය විසින් අවසානයේ ඉදිරි කටයුතු ඉටු කිරීම අපේක්ෂා කරමු. | නියමිත දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2022 හා 2022 පෙබරවාරි 07 දිනැති චක්‍රලේඛය | ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම පළමු හා තෙවන කාර්තුවේදී පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | වර්තමානය වනවිට අප චක්‍රලේඛයේ දක්වා ඇති මහ පෙන්වීම් සමඟ කටයුතු කරන්නෙමු . | විගණන කමිටු රැස්වීම චක්‍රලේඛයට අනුව පැවැත්විය යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2019 හා 2019 මාර්තු 15 දිනැති චක්‍රලේඛය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව (PSC) රැස්වීම මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2019 හා 2019 මාර්තු 15 දිනැති චක්‍රලේඛයෙහි දක්වා ඇති මගපෙන්වීම සමඟ අප එකඟ වී ඇති අතර, සියලුම මෙහෙයුම් කමිටු රැස්වීම් ඒ අනුව සැලසුම් කර ඇත. | මෙහෙයුම් කමිටු (PSC) රැස්වීම චක්‍රලේඛයට අනුව පැවැත්විය යුතුය. |
| (ඇ) | අංක 09/2009 සහ අංක 09/2009 (1) හා 2009 අප්‍රේල් 16 සහ 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි මුද්‍රණ යන්ත්‍රය භාවිත කර නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය මිලදී ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කටයුතු කර ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | චක්‍රලේඛයට අනුව ඇඟිලි මුද්‍රණ යන්ත්‍රය භාවිතා කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 04 දින නිකුත් කරන ලද ව්‍යාපෘති සැලසුම් වාර්තාවට අනුව, ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, මූල්‍ය ගිවිසුම 2021 ජූනි 10 වන දින අත්සන් කර තිබුණි.මෙම ව්‍යාපෘතියේ කාලසීමාව වසර 06 කි. ව්‍යාපෘතිය 2022 අගෝස්තු මාසයේ සිට මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය වාර්තා වී ඇත්තේ සියයට 05ක් පමණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | 2023.12.31 වන විට ව්‍යාපෘති සහභාගිත්ව ගැමි පිවිසුම සහ ව්‍යාපෘතිය මුලපිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | නිශ්චිත කාල රාමුව තුළ කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

### 3.2 ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල් පරිහරණයේ ප්‍රගතිය සලකා බැලීමේදී, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් ණය මුදලින් මුළු ප්‍රතිපාදන වන ඇ.ඩො.මිලියන 41.70 ක මුදලින් ව්‍යාපෘතිය ඇ.ඩො.367,590 ක අරමුදල් පමණක් භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. ප්‍රතිශතයක් ලෙස එය සියයට 1 ක් විය. එබැවින් ඉතිරි වසර තුනහමාරක කාලසීමාව තුල ඉතිරි අරමුදල් සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම වී තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොමැත. | අරමුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ආ) | තවද, ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් එකඟ වූ රජයේ මුළු දායකත්වය ඇ.ඩො.මිලියන 12.70 ක් වන අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජයේ අරමුදලේ සමුච්චිත භාවිතය ඇ.ඩො.මිලියන 0.08 ක් පමණක් වී තිබුණි. එය එකඟ වූ මුදලින් සියයට 0.62 ට සමාන වේ. මෙම ව්‍යාපෘතිය 2027 ජූනි 10 වන විට අවසන් කිරීමට නියමිත අතර ඉදිරි වසර තුනහමාර තුළ එකඟ වූ රජයේ අරමුදලින් ඉතිරි සියයට 99 භාවිතා කිරීම අවිනිශ්චිතය. | කළමනාකාරිත්වය නිරීක්ෂණය පිළිගෙන ඇත. වැඩිදුර පැහැදිලි කිරීමක් ලබා දී නොමැත. | ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කර ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 300 ක ප්‍රතිපූරණය කළ හැකි විදේශ ණය සඳහා වෙන් කළ මුදලින් රු.මිලියන 120.29 ක් පමණක් ව්‍යාපෘතිය සඳහා භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින් මුළු ප්‍රතිපාදනවලින් සියයට 59 ක් නියෝජනය වන පරිදි රු. මිලියන 179.71 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | කළමනාකාරිත්වය නිරීක්ෂණය පිළිගෙන ඇත. වැඩිදුර පැහැදිලි කිරීමක් ලබා දී නොමැත. | අරමුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ රජය වෙන් කළ රු. මිලියන 30 න් රු.මිලියන 20 ක් පමණක් භාවිතා කර තිබුණු අතර ප්‍රයෝජනයට නොගත් ප්‍රමාණය සියයට 33 ක් නියෝජනය කරන රු.මිලියන 10 ක් විය. | 2023.12.31 දිනට භාවිතයට නොගත් රු.මිලියන 10 ක ශේෂය රේඛීය අමාත්‍යාංශයට ආපසු යවන ලදී. | අරමුදල් ඵලදායී හා කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 1/2022 හා 2022 පෙබරවාරි 07 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, වසරකට වැඩි ව්‍යාපෘති කාලසීමාවක් සහ ඇ.ඩො. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම සඳහා වන මූලික ඉල්ලීම 2023 ජූලි 24 දින | චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලියන 05කට වැඩි මුළු පිරිවැයක් සහිත ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 01 දින දක්වා අභ්‍යන්තර විගණකවරයා පත් කර නොතිබුණු අතර බඳවා ගත් පුද්ගලයා රාජකාරි ආවරණ කිරීම සඳහා පත් කරන ලදී. එම පුද්ගලයා ද රැකියාවෙන් ඉවත් වූ අතර 2024 මාර්තු 21 වන දින රාජකාරි ආවරණ සඳහා නව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. | |
| (ආ) | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දින වන විට නිලධාරින් හා සේවකයින් 38 කු බඳවා ගෙන තිබුණි. එම නිලධාරින් හා සේවකයින්ගේ පෞද්ගලික ලිපි ගොනුවල අන්තර්ගතවිය යුතු බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ලේඛන අවිධිමත්ව පැවතුණි. තවද, තනතුරුට අදාළව ඉදිරිපත් කර තිබුණු සහතික පත්‍රවල නිවැරදිතාවය/ සත්‍යතාවය පිළිබඳ එම සහතිකපත් නිකුත්කළ ආයතනවලින් තහවුරු කර ගැනීම් ලබාගෙන නොතිබුණි. | 01/2019 දරණ ව්‍යාපෘති කළමනාකරණ චක්‍රලේඛයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව ලේඛන විධිමත් ලෙස පෙළගැස්වීමට කටයුතු කරන ලදී. මෙම තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද සහතිකවල නිරවද්‍යතාවය සහ සත්‍යතාව තහවුරු කිරීම සඳහා වැඩිදුර ක්‍රියා සිදුවෙමින් පවතී. | සේවකයින්ගේ සුදුසුකම් සත්‍යාපනය කර පුද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**3.4 පද්ධති හා පාලනයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය මගින් රු.25,000ක සුළු මුදල් අග්‍රිම මුදලක් පවත්වාගෙන යයි. සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව, වාර්තාකරණ වර්ෂය අවසානයේ දී සුළු මුදල් අග්‍රිම පියවිය යුතුය. නමුත් ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 වන තෙක් සුළු මුදල් අග්‍රිම ගිණුම පියවා නොතිබුණි. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැළැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | සියලුම සුළු මුදල් අග්‍රිම ගිණුම් වර්ෂය අවසානයේ පියවිය යුතුය. |
| (ආ) | විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව, රු. මිලියන 1 ක රාජකාරි කටයුතු සඳහා සේවකයින් වෙත ලබාදුන් අත්තිකාරම් මුදල 2023 දෙසැම්බර් 31 වන දින දක්වා පියවා නොතිබුණි . | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැළැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර ඇත. | සේවක අත්තිකාරම් ගිණුම් වර්ෂය අවසානයේ පියවිය යුතුය. අත්තිකාරම් පියවා නොගත් සේවකයින්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඇ) | ලෙජර කේත නොමැතිව සාමාන්‍ය ලෙජර පවත්වාගෙන යාම, කාණ්ඩ වශයෙන් ජර්නල් සටහන් ඇතුළත් කිරීම නිසාත් වැරදි ලෙජර සටහන් කිරීම්, වෙනත් කිසිදු නිලධාරියකු විසින් ජර්නල් සටහන්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා නොකිරීම, මුදල් පොත නඩත්තු නොකිරීම යනාදිය සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා නිරීක්ෂණය විය. | අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැළැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කටයුතු කර ඇත. | විධිමත් අභ්‍යන්තර පාලනයන් පවත්වා ගත යුතු අතර නිවැරදි ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් භාවිතා කළ යුතුය. |